# ප්‍රවෘත්ති නිවේදනය

**ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2021 ජනවාරි**

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**මුදල් අමාත්‍යාංශය**

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2021 ජනවාරි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 3.7%ක් බව එහි වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. පසුගිය දෙසැම්බර් මාසයේ මතුපිට උද්ධමනය 4.6%ක් ලෙස වාර්තා විය. 2021 ජනවාරි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 2.7%ක හා ආහාර නොවන කාණ්ඩයේ 1.0%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2020 ජනවාරි මාසයේ 7.6% ක්වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 6.0%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 1.7%ක් විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2020 දෙසැම්බර් මාසයේ 141.2ක් වූ දර්ශකාංකය 2021 ජනවාරි මාසයේ 142. 1ක් දක්වා ඉහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2021 ජනවාරි මාසයේ දර්ශකාංකය 0.9ක වැඩිවීමක් එනම් 0.6ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 0.48%කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 0.14%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකූවිට සහල්, පොල්, අමු මිරිස්, එළවළු, රතු ළූණු, අළුත් මාළු, පළතුරු, කහ කුඩු, පොල්තෙල්, සියඹලා සහ වියළි මිරිස් යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා වී ඇත. එසේ වුවත් ලොකු ළූණු, අර්තාපල්, බිත්තර, මංඤ්ඤොක්කා සහ කුකුළ් මස් යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා විය.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2021 ජනවාරි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා 'සෞඛ්‍ය' (*පෞද්ගලික වෛද්‍ය ගාස්තු, පෞද්ගලික රෝහල් කාමර ගාස්තු*), 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' (*ගෘහ සේවක වැටුප්*), 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' (*ගොඩනැගිලි ද්‍රව්‍ය*), 'ප්‍රවාහන' (*ටයර් සහ මෝටර් රථ අමතර කොටස්*), 'රෙදිපිළි හා පාවහන්', 'විවිධ භාණ්ඩ හා සේවා' සහ 'අධ්‍යාපන' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේ වුවත් පසුගිය මාසය හා සංසන්දනය කලවිට 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' (*පුවක්*) කාණ්ඩයේ මිල අඩුවීමක් වාර්තා වී ඇත. තවද පසුගිය මාසය හා සංසන්දනය කළවිට 'සන්නිවේදන', 'විනෝදාත්මක හා සංස්කෘතික' සහ 'ආපනශාලා සහ හෝටල්' යන කාණ්ඩවල මිල දර්ශක අගය වෙනසක් වී නොමැත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිඹිබු වන යටිදැරි උද්ධමනය (Core Inflation) 2020 දෙසැම්බර් මාසයේ 4.7% සිට 2021 ජනවාරි මාසයේ 4.2% දක්වා අඩුවීමක් වාර්තා විය.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) |
| 2020 | ජන. | 137.0 | 135.3 | 1.5 | 0.8 | 7.6 | 3.9 |
| | පෙබ. | 137.0 | 135.8 | 0.0 | 0.4 | 8.1 | 3.4 |
| | මාර්තු | 135.2 | 136.0 | -1.3 | 0.1 | 7.0 | 3.2 |
| | අප්‍රේල් | 134.8 | 136.9 | -0.3 | 0.7 | 5.9 | 3.2 |
| | මැයි | 135.4 | 137.9 | 0.4 | 0.7 | 5.2 | 3.7 |
| | ජූනි | 137.3 | 138.9 | 1.4 | 0.7 | 6.3 | 4.4 |
| | ජූලි | 137.3 | 139.4 | 0.0 | 0.4 | 6.1 | 4.5 |
| | අගෝ. | 137.8 | 139.9 | 0.4 | 0.4 | 6.2 | 4.6 |
| | සැප්. | 138.9 | 140.4 | 0.8 | 0.4 | 6.4 | 4.8 |
| | ඔක්. | 139.1 | 140.5 | 0.1 | 0.1 | 5.5 | 4.5 |
| | නොවැ. | 139.8 | 140.6 | 0.5 | 0.1 | 5.2 | 4.5 |
| | දෙසැ. | 141.2 | 140.5 | 1.0 | -0.1 | 4.6 | 4.7 |
| 2021 | ජන. | 142.1 | 141.0 | 0.6 | 0.4 | 3.7 | 4.2 |